# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 ඔක්තෝබර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 ඔක්තෝබර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 ඔක්තෝබර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 54/75

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙහි, IIIඅ වන අලුත් කොටස ඇතුළත් කිරීම.

2. ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ III වන කොටසට ඉක්බිතිව ම, පහත සඳහන් අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ පනතේ IIIඅ වන කොටස වශයෙන් බලපවත්වන්නේ ය :—

## ‘IIIඅ වන කොටස

### ප්‍රසිද්ධ සමාගම්වලට අයිතිව තිබෙන වතු ඉඩම්වලට අදාළ විශේෂ විධිවිධාන

ප්‍රසිද්ධ සමාගම්වලට අයිතිව තිබෙන හෝ ප්‍රසිද්ධ සමාගම් සන්තකයෙහි පවත්නා වතු ඉඩම් සතු කර ගැනීම.

42අ. (1) මේ පනතේ මෙම කොටස ක්‍රියාත්මක වන දිනයෙහි ප්‍රසිද්ධ සමාගමකට අයිතිව තිබෙන හෝ ප්‍රසිද්ධ සමාගමක් සන්තකයෙහි පවත්නා සෑම වතු ඉඩමක් ම, ඒ දිනයෙහි සිට බලපැවැත් වෙන පරිදි—

(අ) කොමිෂන් සභාව වෙත සතු වූ ලෙස සහ කොමිෂන් සභාව සන්තකව තිබෙන ලෙස සලකනු ලැබිය යුතු ය; තවි ද

(ආ) ඒ සතුවීමේ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ඒ සමාගම සඳහා සහ වෙනුවෙන් එම වතු ඉඩමේ කළමනාකරණය පිළිබඳව වගකීම දැරූ සහ කළමනාකරණය භාරව සිටි නියෝජිත ආයතනය හෝ සංවිධානය හෝ තැනැත්තා හෝ විසින් කොමිෂන් සභාව සඳහා සහ වෙනුවෙන් ව්‍යවස්ථාපිත භාරයක් යටතේ කළමනාකරණය කරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ නියෝජිත ආයතනය, සංවිධානය හෝ තැනැත්තා, මේ පනතේ මේ කොටසෙහි විධිවිධානවලට යටත්ව එම වතු ඉඩමේ ව්‍යවස්ථාපිත භාරකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

ඒ 10409 – 22,050 (75/09)

(2) (1) වන උපවගන්තිය යටතේ වතු ඉඩමක් සතු කිරීමෙහි, ඒ සතු කිරීමේ දිනයෙහි සිට, සහ මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට යටත්ව සියලු බැඳීම්වලින් තොරව, එම වතු ඉඩමෙහි පරම අයිතිය කොමිෂන් සභාව වෙත ලබා දීමේ බලපෑම ඇත්තේ ය.

(3) ව්‍යවස්ථාපිත භාරකරුවන්ගේ පාරිශ්‍රමික හෝ නියෝජිත ගාස්තු ද ඇතුළුව, ව්‍යවස්ථාපිත භාරයෙහි නියමයන් හා කොන්දේසි, මේ පනතේ මේ කොටසෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට යටත්ව, මෙම පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියමිත පරිදි වන්නේ ය.

සතු කර ගනු ලැබූ වතු ඉඩම් කළමනාකරණය.

42ආ. (1) 42අ වන වගන්තිය යටතේ යම් වතු ඉඩමක් කොමිෂන් සභාව වෙත සතු කරනු ලැබූ අවස්ථාවක, ඒ වතු ඉඩමේ ව්‍යවස්ථාපිත භාරකරු, එම ව්‍යවස්ථාපිත භාරය පවත්නා කාලය තුළ, කොමිෂන් සභාව විසින් කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව එම වතු ඉඩමේ මනා හා නිසි කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(2) ඒ කිසිම ව්‍යවස්ථාපිත භාරකරුවකු, කිසි යම් ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින්, එම වතු ඉඩමේ තත්ත්වය පිරිහියාමට හැරීම හෝ එම වතු ඉඩමේ චංචල හෝ නිශ්චල වත්කම් විනාශ කරනු ලැබීම, නැති කරනු ලැබීම, ඒවාට අලාභ හානි කරනු ලැබීම හෝ ඒවායෙහි අගය ක්ෂය වීමට හැරීම නො කළ යුතු ය.

(3) ඒ සතු කිරීමේ දිනයට පෙරාතුව ම වූ දින යෙහි එම වතු ඉඩමේ නිත්‍යානුකූලව නේවාසිකව සිටි කම්කරුවන්ට එසේ එම වතු ඉඩමෙහි තව දුරටත් නේවාසිකව සිටීමට ඉඩදීම ද ඒ දිනයෙහි එම වතු ඉඩමේ නිත්‍ය සේවයෙහි නියුක්තව සිටි කම්කරුවන් ඉදිරියටත් සේවයෙහි නියුක්ත කර තබා ගැනීම ද ඒ ව්‍යවස්ථාපිත භාරකරුගේ යුතුකම වන්නේ ය.

(4) එවැනි යම් වතු ඉඩමක කළමනාකරණයට, අධීක්ෂණයට හෝ සංවර්ධනයට හෝ ඒ ඉඩමේ පලදාව අලෙවි කිරීමට අදාළ වූ හා මේ පනතෙහි මෙම කොටස ක්‍රියාත්මක වන දිනයෙහි සක්‍රියව පැවති කිසිදු ණය හෝ වෙනත් මුදල් පහසුකම්

සැලැස්වීමක් කොමිෂන් සභාවේ ලිඛිත කැමැත්ත ඇතිව හැර සුළු වශයෙන් වෙනස් කිරීම හෝ වෙනස් කිරීම හෝ නොකළ යුතු ය. තව ද මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන අනුව ක්‍රියා කිරීම ගැන විගබලා ගැනීමේ කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින්, අවශ්‍ය යයි හෝ අවස්ථානුකූල යයි කොමිෂන් සභාව සලකන යම් විධාන, යම් ව්‍යවස්ථාපිත භාරකරුවකු, වාණිජ බැංකුවක්, ප්‍රසිද්ධ සමාගමක්, නියෝජිත ආයතන යක් හෝ භාරකරුවකු වෙත හෝ එම පහසුකම් සැලැස්වීමෙහි වෙනත් යම් පාර්ශ්වකරුවකු වෙත කලින් කල නිකුත් කරනු ලැබිය හැකි අතර, තමා වෙත නිකුත් කරනු ලැබූ එවැනි යම් විධාන යක් අනුව ක්‍රියා කිරීම සෑම තැනැත්තකුගේම යුතුකම වන්නේ ය.

(5) (අ) යම් වතු ඉඩමක් කොමිෂන් සභාව වෙත සතු කරනු ලැබූ අවස්ථාවක, ඒ වතු ඉඩමෙහි කාර්යයන්ට අදාළ වූ ද, ඒ සතු කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පැවතියා වූ ද ප්‍රකාශිත හෝ ගම්‍යමාන යම් ගිවිසුමක් හෝ එකඟවීමක් යටතේ වූ ඒ වතු ඉඩමේ කලින් සිටි හිමිකරුගේ අයිතිවාසි කම් සහ බැඳීම් සහ ඒ දිනයෙහි පැවතියා වූ ද, ඒ වතු ඉඩමේ පාලනයට අදාළ වූ ද ඒ හිමිකරුගේ වෙනත් අයිතිවාසිකම් සහ බැඳීම්, (ආ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ අයිතිවාසි කම් සහ බැඳීම් වන්නේ ය; තව ද ඒ වතු ඉඩම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි ප්‍රමාණයෙන්, ඒ සියලු බැඳීම් නිදහස් කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණ අඩු කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයෙහි සඳහන් යම් බැඳීම් ව්‍යාජ ලෙස, වංක ලෙස හෝ වංචනික ලෙස ඇති කරන ලදැයි අමාත්‍යවරයාගේ මතය වන්නේ නම් ඔහු විසින්, ඕනෑම අවස්ථාවක දී ඒ බැඳීම් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ දැන්වීම අමාත්‍යවරයා විසින්, ඒ ප්‍රතික්ෂේප කිරීම බලපාන පාර්ශ්වකරුවන් වෙත දෙනු ලැබිය යුතු ය.

(ඇ) යම් බැඳීම් අමාත්‍යවරයා විසින් (ආ) ඡේදය යටතේ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථා වක ඒ බැඳීම් කිසි විටකත් කොමිෂන් සභාවේ බැඳීම් නොවූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ව්‍යවස්ථාපිත භාරකරුවන් විසින් පැවැත්විය යුතු වාර්තා.

41ආ. (1) සෑම වතු ඉඩමක් මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව වෙත සතු කරනු ලැබූ අවස්ථාවක, ඒ සතු කිරීමේ දිනයේ සිට මාසයක් ඇතුළත පහත සඳහන් විස්තර ඇතුළත් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ලියවිල්ලකින් සැපයීම ඒ වතු ඉඩමේ ව්‍යවස්ථාපිත භාරකරුගේ යුතුකම වන්නේ ය:—

(අ) වතු ඉඩමේ නම සහ ලියුම් ලැබෙන ලිපිනය;

(ආ) වතු ඉඩමේ කලින් සිටි හිමිකරුගේ නම සහ ලිපිනය;

(ඇ) වතු ඉඩමෙහි විස්තීර්ණය සහ ප්‍රමාණය, එහි ඇති වගාවන්, ඒ එක් එක් වගාවට යටත් ඇති බිම් ප්‍රමාණය සහ සතු කර ගැනීමේ දිනයට පෙරාතුව ම වූ මූල්‍ය වර්ෂ පහෙන් එක් එක් වර්ෂයේ දී එම වගාවල ඵලදාව;

(ඈ) වතු ඉඩමට අයත් ගොඩනැගිලි, කර්මාන්තශාලා, යන්ත්‍ර, උපකරණ, මාර්ග සහ මංවල් යන නිශ්චල වෙනත් දේවල් පිළිබඳ විස්තරයක්;

(ඉ) සතු කර ගැනීමේ දිනයට පෙරාතුව ම වූ ගිණුම් වර්ෂ පහෙන් එක් එක් වර්ෂය සඳහා ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම;

(ඊ) සතු කර ගැනීමේ දිනයට පෙරාතුව ම වූ ගිණුම් වර්ෂ තුනෙන් එක් එක් වර්ෂය තුළ එම වතු ඉඩම වෙනුවෙන් ගෙවිය යුතු යම් බද්දක් සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශවල පිටපතක්;

(උ) සතු කර ගැනීමේ දිනයට පෙරාතුව ම වූ ගිණුම් වර්ෂ පහෙන් එක් එක් වර්ෂය සඳහා කලින් සිටි හිමිකරු විසින් ප්‍රකාශිත අතුරු හා අවසාන ලාභාංශ ප්‍රකාශයන්;

(ඌ) සතු කර ගැනීමේ දිනයට පෙරාතුව ම වූ වර්ෂ තුන තුළ සිදු වූ, ව්‍යවස්ථාපිත භාරකරු දන්නා වෙනත් වතු ඉඩම් විකිණීම් එම ප්‍රතිපාලිත දිස්ත්‍රික්කය තුළ වෙතොත් ඒ විකිණීම් පිළිබඳ විස්තර; සහ

(එ) නියම කරනු ලබන වෙනත් විස්තර.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත සපයනු ලබන ප්‍රකාශයේ පිටපතක් ව්‍යවස්ථාපිත භාරකරු විසින් ඒ වතු ඉඩමේ කලින් සිටි හිමිකරු වෙත යැවිය යුතු අතර ඒ පිටපත තමා වෙත ලැබ් දින අනුව සති ඇතුළත ඒ පිටපතේ ඇතුළත් තොරතුරු සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ කිසිවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට ඒ හිමිකරුට අයිතිවාසිකම් ඇත්තේ ය.

(3) සතු කිරීමේ දින සිට මාස හතරක් ඇතුළත—

(අ) පෙරාතුව වූ ගිණුම් වර්ෂයේ අවසාන දිනයට පසු දිනයෙන් ආරම්භ වන සහ සතු කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයෙන් අවසාන වන කාල සීමාව සඳහා වූ ලාභාලාභ ගිණුමක් ;

(ආ) සතු කිරීමේ දිනයට පෙරාතුව ම වූ දින යෙහි පැවති පරිදි ශේෂ පත්‍රය ; සහ

(ඇ) නියම කරනු ලැබිය හැකි වෙනත් තොරතුරු

ඒ වතු ඉඩම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත සැපයීම ඒ වතු ඉඩමේ ව්‍යවස්ථාපිත භාර කරුගේ යුතුකම වන්නේ ය.

සතු කර ගන්නා ලද වතු ඉඩම් වල නීති විරෝධී පදිංචි කරුවන් නෙරපීම.

42ඇ. (1) කොමිෂන් සභාව වෙත සතු කරනු ලැබූ යම් වතු ඉඩමක නීත්‍යානුකූල පදිංචිකරුවකු නොවන යම් තැනැත්තකු එම වතු ඉඩමෙහි පදිංචි වීමට උත්සාහ කරන හෝ පදිංචිවන අවස්ථාවක, ඒ බව කොමිෂන් සභාව වෙත සහ ළඟම පිහිටි පොලිස් ස්ථානය භාරව සිටින පොලිස් නිලධරයා වෙත ලියවිල්ලකින් වහාම වාර්තා කිරීම ව්‍යවස්ථාපිත භාරකරුගේ සහ එම වතු ඉඩමේ අධිකාරිවර යාගේ යුතුකම වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබුණ විට එම වතු ඉඩමෙන් එම තැනැත්තන් නෙරපීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ බලයලත් නිලධරයකු හෝ නියෝජිතයකු විසින් යම් පොලිස් නිලධරයකුට විධාන කළ හැකිය. තවද එම විධාන අනුව ක්‍රියා කරනු පිණිස ඒ පොලිස් නිලධරයා විසින් පියවර ගත යුතු අතර ඒ සඳහා අවශ්‍ය බලය පාවිච්චි කිරීම ද ඔහු විසින් කළ හැකි ය.

(3) කොමිෂන් සභාවේ බලයලත් නිලධරයාට හෝ නියෝජිතයාට එම වතු ඉඩමෙන් එම තැනැත්තන් නෙරපීමට නොහැකි වන හෝ නොහැකි වෙතැයි හැඟී යන අවස්ථාවක, ඔහු විසින් ඒ වතු ඉඩම පිහිටා ඇති ප්‍රදේශයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, එම තැනැත්තන් එම වතු ඉඩමෙන් නෙරපීමට පිස්කල්ට විධාන කෙරෙන අධිකරණයේ ඒක පාක්ෂික ආඥාවක් ලැබීමට ඔහුට හිමිකම් ඇත්තේ ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ආඥාවක් මහේස්ත්‍රාත් අධිකරණය විසින් පිස්කල් වෙත නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් ඒ ආඥාව වහාම ක්‍රියාවෙහි යෙදවිය යුතු අතර ඒ ආඥාව ක්‍රියාවෙහි යෙදූ ආකාරය අධිකරණය වෙත ලියවිල්ලකින් වාර්තා කළ යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් නිකුත් කරන ලද ආඥාවක් ක්‍රියාවෙහි යෙදවීමේ කාර්යය සඳහා පිස්කල් විසින් හෝ ඔහුගේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් ඕනෑම පොලිස් නිලධරයකුගේ සහාය ලබා ගැනීම ද, එම වතු ඉඩමට ඇතුළු වී එම තැනැත්තන් සහ ඔවුන් ගෙන් යැපෙන්නන් කිසිවකු වේනොත් ඔවුන් එම වතු ඉඩමෙන් ඉවත් කිරීම පිණිස අවශ්‍ය විය හැකි බලය පාවිච්චි කිරීම ද කළ හැකි ය.

වතු ඉඩම සතු කිරීම පරවශතා කෙරෙහි බල නොපෑ යුතු බව.

42ඉ. යම් වතු ඉඩමක් පිළිබඳ වූ කිසිම පරවශතාවක් කොමිෂන් සභාව විසින් අවසාන කරනු ලැබ ඇති නම් මිස සහ එසේ අවසාන කරනු ලබන තුරු, මේ පනතේ මේ කොටසේ විධිවිධාන යටතේ ඒ වතු ඉඩම කොමිෂන් සභාව වෙත සතු කිරීමෙන් ඒ පරවශතාව කෙරෙහි කිසිදු ආකාරයක බලපෑමක් ඇති නොවිය යුතු ය. ඒ පරවශතාව එසේ අවසන් කරනු ලැබූ අවස්ථාවක, ඒ පරවශතාවෙහි හිමිකරු වන්දියකට හිමිකම් ලබන්නේ ය.

උකසට, බද්දට, ඵල භුක්ති යට හෝ ජීවිත භුක්තියට යටත් වතු ඉඩම.

42ඊ. උකසකට, බද්දකට, ඵල භුක්තියකට හෝ ජීවිත භුක්තියකට යටත් යම් වතු ඉඩමක් මේ පනතේ මේ කොටසේ විධිවිධාන යටතේ කොමිෂන් සභාව වෙත සතු කරන ලද අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එම උකස්හිමියාට, බදු ගැනුම්කරුට, ඵල භුක්තිකරුට හෝ ජීවිත භුක්තිය දරන්නාට, එම වතු ඉඩමෙහි ලා වූ තමාගේ සම්බන්ධතාවේ ප්‍රමාණයට, ඒ වතු ඉඩම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය කෙරෙහි කාප අයිතියක් ඇත්තේ ය.

ව්‍යවස්ථාපිත භාරය අවසන් කිරීම.

42ළ. 42අ වන වගන්තිය යටතේ වූ යම් ව්‍යවස්ථාපිත භාරයක් කොමිෂන් සභාවේ මනාපය පරිදි කවර විටක වුවත් අවසන් කරනු ලැබිය හැකි අතර කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක් කවර විටක වුවත් කොමිෂන් සභාවේ සන්තකයට ගත හැකි ය. එම භාරය, කලින් අවසන් කරනු ලැබුවහොත් මිස, සතු කිරීමේ දිනයේ සිට එක් වර්ෂයක් පැවතිය යුතු අතර එය දීර්ඝ කිරීමට කොමිෂන් සභාව තීරණය කරන හොත් තවත් වර්ෂයක් පවතින්නේ ය. අමාත්‍යවරයාගේ ප්‍රකාශිත අනුමතිය ඇතිව මිස, කිසිම ව්‍යවස්ථාපිත භාරයක් ඊට වඩා වැඩි කාලයකට කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන යා නොහැකි ය.

කොමිෂන් සභාව වෙත සතු කරන ලද වතු ඉඩම් යෙදිය යුත්තේ කුමන කාර්ය සඳහා ද යන වග.

42ළු. (1) මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක් පනත සඳහන් කාර්යයන් අතුරින් යම් කාර්යයක් සඳහා යොදා ගත හැකි ය:—

(අ) කෘෂිකාර්මික සංවර්ධනය හෝ සත්ත්ව පාලනය සඳහා හෝ සමූපකාර හෝ සාමූහික ගොවිපලක් හෝ ව්‍යාපාරයක් සඳහා තැනැත්තන්ට විකිණීම, හුවමාරු කිරීම, කුලී සින්න ක්‍රමයට දීම හෝ බදු දීම මගින් පවරා දීම;

(ආ) පදිංචිවීමේ නිවාස සෑදීම සඳහා තනි කැබලි වශයෙන් තැනැත්තන්ට විකිණීම මගින් පවරා දීම;

(ඇ) 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂි කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවකට හෝ 1958 අංක 4 දරන ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා දීම;

(ඈ) කොමිෂන් සභාව විසින් කෙළින්ම හෝ එහි නියෝජිතයන් මගින් කළමනාකරණය කරනු ලබන ගොවිපලක් හෝ වැවිලි කර්මාන්තයක් සඳහා;

(ඉ) ගම් පුළුල් කිරීම හෝ වෙනත් පොදු කාර්යයක් සඳහා.

(3) කොම්පැනි සභාව වෙත සතු කරන ලද වතු ඉඩම් යෙදවිය හැකි කාර්යයන් නිර්ණය කිරීමේ දී කොම්පැනි සභාව, අමාත්‍යවරයා විසින් ඒ සඳහා කලින් කල නිකුත් කරනු ලැබිය හැකි විධානවලට යටත් විය යුතු ය.

වන්දි.

42ඊ. (1) මේ පනතේ මේ කොටස යටතේ කොම්පැනි සභාව වෙත සතු කරනු ලබන සෑම වතු ඉඩමක් වෙනුවෙන්ම වන්දි ගෙවිය යුතු ය.

(2) කොම්පැනි සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක් වෙනුවෙන් ගෙවිය යුතු වන්දියේ ප්‍රමාණය ප්‍රධාන තක්සේරුකරුගේ මතය අනුව සතු කිරීමේ දිනයේදී එම වතු ඉඩමේ සාධාරණ වටිනාකම වන මුදල වන්නේ ය. වන්දියේ ප්‍රමාණය නිර්ණය කිරීමේ දී, ප්‍රධාන තක්සේරුකරු, අනිකුත් කරුණුවලට අමතරව සතු කිරීමේ දිනයේදී වතු ඉඩමේ තත්ත්වය, සතු කිරීමේ දිනයට පෙරාතුව ම වූ ගිණුම් වර්ෂ පහේ එක් එක් වර්ෂය සඳහා එහි හිමිකරු විසින් ප්‍රකාශ කරන ලද ලාභාංශ සහ ලාභ සහ එම වතු ඉඩම පිහිටි ප්‍රදේශයේ වතු ඉඩම් එහි වතු ඉඩම සතු කිරීමේ දිනයට පෙරාතුව ම වූ වර්ෂ තුනක කාල පරිච්ඡේදය ඇතුළත විකුණනු ලැබූ මිල ද සැලකිල්ලට ගත යුතු ය.

(3) වන්දි ගෙවිය යුතු ක්‍රමය සහ ආකාරය මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලැබිය යුතු ය.

(4) ගෙවිය යුතු වන්දියෙන්, මේ පනතේ මේ කොටස යටතේ අඩු කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක් හැර, ඉතිරි කොටසට, එම වන්දිය හිමි වූ දිනයේ සිට එම වන්දිය ගෙවනු ලබන දිනය තෙක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයකට පොලී හිමි වන්නේ ය.

(5) මේ පනතේ මේ කොටස යටතේ කොම්පැනි සභාව වෙත සතු කරන ලද වතු ඉඩම් විෂයයෙහි 20 සිට 40 දක්වා වූ (දෙකම ඇතුළු) වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

(6) කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක් වෙනුවෙන් යම් තැනැත්තකුට වන්දියක් හිමිවන අවස්ථාවක—

(අ) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ තැනැත්තාගෙන් අය විය යුතු බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අත්සන යටතේ කොමිෂන් සභාවට සහතික කරන ලද යම් මුදලක් වේ නම් එම මුදල දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ද ;

(ආ) එම වතු ඉඩමේ සේවයේ නියුක්තව සිටින යම් තැනැත්තකුට හිඟ මැටුප්, අර්ථසාධක අරමුදල් දායක මුදල්, පාරිතෝෂික හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ වශයෙන් ඒ තැනැත්තාගෙන් අය විය යුතු බවට ඒ වතු ඉඩම සතු කිරීමේ දින සිට එක් අවුරුද්දක කාල සීමාවක් ඇතුළත කම්කරු කොමසාරිස්වරයාගේ අත්සන යටතේ කොමිෂන් සභාවට සහතික කරන ලද යම් මුදලක් වේ නම්, එම මුදල කම්කරු කොමසාරිස්වරයාට ද

කොමිෂන් සභාව විසින් එම වන්දි මුදලෙන් ඒ තැනැත්තා වෙත සාධාරණ කාලයක අනුව දීමක් කිරීමෙන් පසුව ගෙවිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්යයන් සඳහා "වන්දි" යන යෙදුමට එම වන්දි මුදලට අය වූ යම් පොලියක් ද ඇතුළත් වේ.

(7) මේ වගන්තියේ (1) සිට (5) දක්වා වූ උපවගන්තිවල (දෙකම ඇතුළුව) විධිවිධාන කුමක් වුව ද, මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක් වෙනුවෙන් වන්දිවලට හිමිකම් ඇති යම් තැනැත්තකුට, අමාත්‍යවරයා සහ එම තැනැත්තා අතර එම වතු ඉඩම සඳහා වූ වන්දියේ ප්‍රමාණය සහ එය ගෙවිය යුතු ක්‍රමය සහ ආකාරය සම්බන්ධයෙන් ඇති කර ගත් එකඟවීමක් හෝ සාකච්ඡා මගින් ඇති කර ගන්නා ලද බේරුම් කිරීමක් අනුව මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් විධාන කරනු ලබන මුදලක් එසේ විධාන කරනු ලබන ක්‍රමයකින් හෝ ආකාරයකින් කොමිෂන් සභාව විසින් ගෙවිය හැකි ය.

(8) මේ වගන්තියේ විධිවිධාන අනුව යම් වතු ඉඩමක් සම්බන්ධයෙන් වන්දි ගෙවනු ලැබ තිබෙන අවස්ථාවක, ඒ වන්දිය ගෙවනු ලැබූ තැනැත්තාට හෝ වෙනත් තැනැත්තකුට කොමිෂන් සභාවට විරුද්ධව වැඩිදුර හිමිකම් පෑමක් කරනු ලැබීමට ඉඩ නොදිය යුතු අතර ඒ වැඩිදුර හිමිකම් පෑම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට විරුද්ධව යම් අධිකරණයක දී කිසිම නඩුවක් පැවරිය නොහැක්කේ ය.

නියෝජිත ආයතනවල හෝ සංවිධානවල වෙළෙඳ ව්‍යාපාර සතු කර ගැනීම.

42ඒ. මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, මේ පනතේ මේ කොටස යටතේ වූ, කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක ව්‍යවස්ථාපිත භාරකරු වන යම් නියෝජිත ආයතනයක හෝ සංවිධානයක වෙළෙඳ ව්‍යාපාරයක් ආණ්ඩුව වෙත සතු කිරීම අවශ්‍ය යයි, වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයා, ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව, අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවක, 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනතේ විධිවිධාන යටතේ ඒ වෙළෙඳ ව්‍යාපාරය ආණ්ඩුව වෙත සතු කර ගන්නා ලෙස අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිය හැකි අතර, ඒ අනුව, මුදල් අමාත්‍යවරයා විසින් ඒ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ඒ වෙළෙඳ ව්‍යාපාරය ආණ්ඩුව වෙත සතු කරනු ලැබිය හැකි ය.

නියෝජිත ආයතනවල සහ සංවිධානවල අධ්‍යක්ෂවරුන් පත් කිරීම සහ ඉවත් කිරීම.

42බී. (1) කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක මනා සහ නිසි කළමනාකරණය සඳහා, මේ පනතේ මේ කොටස යටතේ වූ, ඒ වතු ඉඩමේ ව්‍යවස්ථාපිත භාරකරු වන නියෝජිත ආයතනයේ හෝ සංවිධානයේ යම් අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් විධායක නිලධරයකු ධුරයෙන් ඉවත් කිරීම හෝ යම් තැනැත්තකු අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් විධායක නිලධරයකු වශයෙන් පත් කිරීම හෝ අවශ්‍ය යයි අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක්—

(අ) ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ සිට බලපැවැත්විය යුතු ය;

(ආ) වෙන යම් නීතියක කුමක් සඳහන් වුව ද වලංගුව බලපැවැත්විය යුතු ය;

(ඇ) කවර වූ හෝ හේතුවක් මත හෝ යම් අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාර යක දී හෝ ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය; තව ද

ඒ නියමය කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට, අවස්ථාවෝචිත පරිදි, පත් කරනු ලැබූ ලෙස හෝ තම ධුරය අත්හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

42ඖ. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ පනතේ මේ කොටසෙහි—

"වතු ඉඩම" යන්නෙන්, අක්කර පනහකට වැඩි ප්‍රමාණයක තේ, රබර්, පොල් හෝ වෙන යම් කෘෂිකාර්මික බෝගයක් වගා කර තිබෙන හෝ යම් කෘෂිකාර්මික කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් ඉඩමක් අදහස් වන අතර ඊට, එම ඉඩමේ නොවිකුණූ පලදාව සහ ඒ ඉඩමේ හිමිකරුට අයත් වූ ද එම ඉඩමේ කාර්යයන් සඳහා යොදා ගනු ලබන්නා වූ ද සියලුම ගොඩනැගිලි, සවිකිරීම්, යන්ත්‍ර, උපකරණ, වාහන සහ මංචල සහ නිශ්චල දේවල් ද වෙනත් සියලු වත්කම් ද ඇතුළත් වේ.'.